# ඉස්ලාමය සාමකාමී දහමක් ද?

නමුත් තවත් මතයක් වන්නේ මුල්යුගයේ අන්‍යාගමිකයන් සමග සාමකාමී ව කටයුතු කිරීමට අණ කර තිබුණත් පසුව එය වෙනස් කර ඇති බව යි. යම්කිසි කුරාන වැකි දෙකක් අතර ගැටුමක් තිබුණහොත් පසුව පහළ වූ වැකිය වලංගු බවටත් එය විසින් ඊට පෙර පහළ වූ වැකිය අහෝසි කර ඇති බවටත් සැලකේ. විශිෂ්ටයන් ලෙස පිළිගනු ලබන මධ්‍යකාලීන යුගයේ විසූ ඉස්ලාමීය විද්වතුන් එක්තරා පිරිසකගේ අදහස වී ඇත්තේ ආගමෙහි බලකිරීම් නොමැති බව පවසන **2: 256** වැකිය සහ තවත් එවැනි අන්‍යයන් සමග සාමකාමීව කටයුතු කළ යුතු බව පවසන වැකි රැසක්, අන්‍යාගමිකයන් දුටුතැන මරාදැමිය යුතු බව කියන **9: 5** වැකිය විසින් අවලංගු කර ඇති බව යි.

ශ්‍රී ලංකාව තුළ ඉස්ලාමීය ත්‍රස්ත ක්‍රියාකාරකම් පැන නැගීමත් සමග ඉස්ලාම් දහම අන්‍යාගමිකයන් සම්බන්ධයෙන් කුමක් පවසන්නේ ද යන ගැටලුව පැන නැගී ඇත. මේ පිළිබඳ ව විවාදය ඉතා වැදගත් වන්නේ මෙවැනි ව්‍යාපාර සහ ක්‍රියාකාරකම් සඳහා කිසියම් හෝ න්‍යායික පදනමක් ඉස්ලාමය තුළින් සපයා ගත හැකි නම් එකී ඉඩ වටහාගැනීම මේ කරා තරුණ පිරිස් ඇදී යාම වැළැක්වීමට මහගු පිටිවහලක් වන හෙයිනි. ඉතාමත් බුද්ධිමත්, ඉහළ අධ්‍යාපනයක් ලද දරිද්‍රතාවය හෝ සමාජ අසාධාරණය වැනි හේතූන්ගෙන් ද පීඩාවක් නොලද පිරිස් මේ කරා ලංකාව තුළ මෙන් ම ගෝලීය ව ද ඇදී යන්නේ ඇයි ද යන්න වටහා ගැනීම සඳහා එළියක් ඒ විසින් දැල්වෙනු ඇත.

ත්‍රස්ත ක්‍රියා ගැන මාධ්‍යයට අදහස් දැක්වූ ඉස්ලාම් පූජකවරුන් මෙන් ම මුස්ලිම් දේශපාලකයන් ද පැවසූ කරුණක් වන්නේ මෙයට කිසිම ආගමක සම්බන්ධයක් නැති බව ය. ඉස්ලාම් දහම තුළ කිසිදු ආකාරයකින් ප්‍රචණ්ඩත්වයට ඉඩක් නොමැති බව ය. මේ පිළිබඳ ව ගැඹුරින් විශ්ලේෂණය කිරීමට පෙර පිළිගත් ඉස්ලාමීය මූලාශ්‍රයක නබිතුමන් පැවසූ බවට සඳහන් කෙරෙන කියුමක් උපුටා දැක්වීම මැනවැයි සිතමි.

> අල්ලාහ්ගේ දූතයා මෙසේ පැවසුවේ ය. අල්ලාහ් හැර වෙනත් කිසිම දෙවියකු නැති බවත් මුහම්මද් යනු ඔහුගේ දූතයා බවත් පවසා සලාතය ඉටුකර සදකා බද්ද ගෙවන තුරු මිනිසුන්ට එරෙහිව සටන් කිරීමට මට අල්ලාහ්ගෙන් අණ ලැබී ඇත්තේ ය. ඔවුන් මෙය ඉටුකළහොත් ඔවුන්ගේ ජීවිත සහ ධනය මාගෙන් බේරාගැනීමට හැකිවනු ඇත. එවිට මා ඔවුන්ගේ ජීවිත හෝ ධනය නැතිකරනු ලබන්නේ යුක්තිය පසිඳලීමක දී පමණක් වන අතර ඔවුන් ගැන අල්ලාහ් විසින් වගබලාගනු ඇත.[1]
>
> (බුහාරි ග්‍රන්ථය- ඉංග්‍රීසි පරිවර්තන මාලාව : වෙළුම 1, ග්‍රන්ථය 2, හදීත් අංක 25)

ඉබ්න් උමර් නම් නබිවරයාගේ සමීපතමයා විසින් වාර්තා කරන ලදු ව බුහාරි සහ මුස්ලිම් යන හදීත් එකතු තුළ සඳහන් වන මෙම නබිවදන එහි අරුත ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබේ. ඉස්ලාමය පිළිගන්නා තුරු හෙවත් අදහන තුරු මිනිසුන් සමග සටන්කිරීමට දෙවියන්වහන්සේ අණ කර ඇත. ජීවිත ආරක්ෂා කරගැනීමට නම් කළ යුත්තේ ඉස්ලාමය වැළඳගැනීම ම පමණි. කෙසේනමුත් මේ පිළිබඳව ඉස්ලාම් විද්වතුන් බහුතරයක් අර්ථ දක්වා ඇත්තේ මෙය ඉතා මුරණ්ඩු පිරිසක් වූ නබිතුමාගේ සනුහරය වන කුරයිෂ්වරුන්ට පමණක් අදාල වන්නක් බව යි. ඔවුන්ගේ මුරණ්ඩු බව දැනසිටි බැවින් නබිතුමා ඔවුන්ට ඉස්ලාමය වැළඳගැනීම හැර වෙන කිසිම විකල්පයක් ලබා නොදුන් බව යි. ආචාර්ය ෂිබ්රි අලි පවසන්නේ මෙය අද දවසේ දී අදාල කිරීමට මුස්ලිම්වරුන් බැඳී නැති බව ය.[2] නමුත් අද දවසේ නොකළ යුතු බව කීමෙන් ගම්‍ය වන අනෙක් කරුණ වන්නේ එදා දවසේ ඔවුන් එසේ කළ බව ය. මේ බව මධ්‍යකාලීන යුගයේ විසූ විශිෂ්ඨ ඉස්ලාමීය විද්වතකු වන ඉබ්න් කාතිර්ගේ කුරාන් අර්ථ විවරණයෙන් ද පැහැදිලි වේ.

> අවිශ්වාසවන්තයන් සමග සටන් කරන ලෙස අල්ලාහ් සිය විශ්වාසවන්තයන්ට අණ කරයි. පළමුව ඉස්ලාමීය අධිරාජ්‍යට ආසන්න ප්‍රදේශවල සිටින්නන්ට එදිරිවත් දෙවනුව ඊට ඈත ප්‍රදේශවල සිටින්නන්ට එරෙහිවත් එම සංග්‍රාමය ව්‍යාප්ත කරන ලෙස හෙතෙම අණ කරයි. නබිතුමන් අරාබි

1 https://sunnah.com/bukhari/2/18

2 https://www.youtube.com/watch?reload=9&v=Coo6Po_7STk

අර්ධද්වීපයේ සිටි පිළිම අදහන්නන්ට එරෙහිව සටන් කිරීම ඇරඹුවේ මේ නිසා ය. ඔවුන් සමග සටන් කර අවසන් වූ පසු ඔහු පුස්තකයේ සඳහන් අය සමග සටන් ආරම්භ කළේ ය.[3]
(The Order for Jihad against the Disbelievers, the Closest, then the Farthest Areas – 2:123 වන ආයාවේ විවරණය)

මෙහි පුස්තකයේ සඳහන් අය යනු කිතුනුවන් සහ යුදෙව්වන් වැනි දෙවියන්වහන්සේ විසින් ඊට පෙර පහළ කළ වෙනත් ආගම් අදහන අයයි. කාතිර් තවදුරටත් පෙන්වා දෙන්නේ මේ ව්‍යාපාරය නබිතුමාගෙන් පසු පත් වූ කාලිෆ්වරුන් විසින් ද නොකඩවා ගෙනගිය බව ය. මෙහි මා දැක්වූ කරුණුවලට එරෙහි ව මුස්ලිම්වරයකු එකහෙලා දැක්විය හැකි කරුණ විය හැක්කේ මා දැක්වූ මෙම මූලාශ්‍ර ද්විතීයික හෝ තෘතීයික මූලාශ්‍ර බවත් ඉස්ලාමයේ පළමු මූලාශ්‍රය වන කුරානය සලකා නොමැති බවත් ය. කුරානය ගත් විට එහි අන්‍යාගමිකයන් සමග සහජීවනයෙන් කටයුතු කරන ලෙසත්, ඔවුන්ගේ ආගම්වලට ගරු කරන ලෙසත්, ඉස්ලාමය බලෙන් පැටවීමට අයිතියක් නොමැති බවත් පවසන වැකි බොහෝ ඇත. නිදසුන් කීපයක් දක්වමි.

ඉස්ලාම් ධර්මයෙහි බලකිරීමක් නැත. (2:256)

අල්ලාහ් නොවන කුමන දෙයක් ඔවුන් දෙවිවරුන් යැයි ආරාධනා කරන්නෙහු ද ඔබ ඔවුන්ට දොස් නොකියනු. එමගින් ඔවුන් නොදැනුවත්කමේ හේතුවෙන් සීමාව ඉක්මවා අල්ලාහ්ටද බැන වදිනු ඇත. මෙසේ  ම සෑම සමූහයන්ටම අපි ඔවුන්ගේ ක්‍රියාවන් අලංකාරවත් කර තබා ඇත්තෙමු. (6:108)

නබියේ ඔබ මෙසේ පවසනු. කුර්ආනය වන මෙය ඔබ විශ්වාස කරනු. නැතිනම් නොකර සිටිනු. ඒ ගැන අපට කිසිම ගැටලුවක් නැත. (17: 107-109)

ඔබට ඔබගේ මාර්ගය. මා හට මාගේ මාර්ගය. (109 – 6)

නමුත් කුරානයේ තවත් තැන් හි අන්‍යාගමිකයන්ට එරෙහිව සටන් කරන ලෙස පවසන වැකි ද ඇත.

අවිශ්වාසවන්තයන් ව දුටුතැන කපා දමනු. ඔවුන් කරමින් සිටින්නේ මරාදැමීමට වඩා ඉතාමත් නරක දෙයකි. (2: 191)

ප්‍රතික්ෂේප කරන්නන්ව ඔබ හමුවන්නේ නම්, ඔවුන්ගේ බෙලි කපා දමනු. ඔවුන්ව ඔබ පරදවා හැරියහොත් සිරභාරයට ගෙන බැද තබනු. ඉන්පසුව යම්කිසි වන්දියක් ලදහොත් හෝ අනුකම්පාවෙන් හෝ අත හැර දමනු. එසේ ඔවුන් තම ආයුධ බිම තබන තුරු යුද්ධ කරනු. මෙය අල්ලාහ්ගේ නියෝගයකි. අල්ලාහ් අදහස් කර තිබුනේ නම් ඔහු ම ඔවුන්ගෙන් පළිගන්නට තිබුණි. එහෙත් ඔහු යුද්ධය මගින් ඔබව පිරික්සන්නේය. එබැවින් අල්ලාහ්ගේ මාර්ගයේ කවුරුන් හෝ මරණයට පත්වන්නෝද ඔවුන්ගේ ක්‍රියාවන් අපතේ හරින්නේ නැත. ඔවුන්ව ඍජු මාර්ගයෙහි ඇතුළු කර, ඔවුන්ගේ තත්වයද පිළිසකර කර හරිනු ඇත. තවද ඔහු ඔවුන්ට දැනුම් දෙනු ලැබූ ස්වර්ගයෙහිද ඔවුන්ව ඇතුළු කරන්නේය. (47: 4-6)

ආරවුල පහ වී ධර්මය අල්ලාහ් උදෙසා ම වන තුරු ඔවුන්ට විරුද්ධව යුද්ධ කරනු. නමුත් ඔවුන් ඇත්වුවහොත් අපරාධ කරන්නන් හැර අන් අයට වේදනා කර සීමාව ඉක්මවා නොයනු (2: 193)

අල්ලාහ්ගේ මාර්ගයෙහි ඔබ යුද්ධ කරනු. (2: 244-245)

ප්‍රතික්ෂේප කරන්නන්ගේ හෘදයන්හි අපි බිය ඇතිකරන්නෙමු යයි පවසා ඔබ ඔවුන්ගේ පිටි බෙල්ලට උඩින් කපා දමනු. ඔවුන්ව හන්දිවලින් කැලි කැලිවලට කපා දමනු. (8: 12)

සමානයන් තැබීමෙන්ද ප්‍රතික්ෂේප කිරීමෙන්ද ඔබ ඇත් වුවහොත් එය ඔබට ඉතාමත් හොදය. එසේ නොමැතිව ඔබ ප්‍රතික්ෂේප කළහොත් නම්, නියත වශයෙන්ම ඔබ අල්ලාහ්ව පරාජය කර දැමීමට

3 http://www.qtafsir.com/index.php?option=com_content&task=view&id=1578

> නොහැකිය යන්න ස්ථිර වශයෙන් දැන ගනු. නබියේ මෙම ප්‍රතික්ෂේප කරන්නන්ට වේදනා ගෙනදෙන දඬුවමෙන් ඔබ ශුභාරංචි දෙනු මැනව. (9: 3)

> ශුද්ධ වූ මාස හතර ගෙවී ගිය තැන සමානයන් තබන්නන්ව දුටු තැන කපාදමනු. ඔවුන්ව සිරගත කර තබනු. ඔවුන්ව මුද්‍රා තබනු. සෑම සැඟවෙන ස්ථානයකම ඔවුන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සැඟවී සිටිනු. ඔවුන් පසුතැවිලි වී ඇත් වී සලාතයද නොකඩවා ඉටුකර, සකාතයද ගෙවමින් සිටියහොත් ඔබ ඔවුන්ව යුද්ධ නොකර අතහැර දමනු. (9: 5-6)

> නබියේ ප්‍රතික්ෂේප කරන්නන් සමගද, (ධර්මය අදහන බව පෙන්වන) වංචනිකයන් සමගද ඔබ යුද්ධ කරනු මැනව (9: 73)

> විශ්වාසවන්තයිනි, ධර්මය පහළ කරනු ලැබූවන්ගෙන් කවුරුන් අල්ලාහ්වද අවසාන දිනයද විශ්වාස නොකරද, අල්ලාහ්ද ඔහුගේ දූතයාද තහනම් කරනු ලැබූ දෙය සුදුසු නැතැයි යන්න අදහස් නොකරද, මෙම සත්‍ය ධර්මය අනුගමනය නොකර සිටින්නෝද, ඔවුන් තමන්ගේ අත්වලින් යටහත්ව ජිස්යා නමැති කප්පම් ගෙවන තුරු ඔබ ඔවුන් සමග යුද්ධ කරනු. (9: 29)

මේ අනුව කුරානයේ එන සාමකාමීත්වයට අනුබල දෙන වැකිත් අන්‍යාගමිකයන්ට එරෙහිව සටන් කරන ලෙස පවසන වැකිත් හේතුවෙන් මහත් ගැටලුසහගත තත්වයක් ඇති වේ. ඒ ඉස්ලාමය සැබවින් ම පවසන්නේ කුමක් ද යන්න යි. ඔවුන් මෙහි සාමකාමී වැකි ආදර්ශයට ගෙන අන්‍යාගමිකයන්ට කැමති ආගමක් ඇදහීමේ අයිතිය පිළිගත යුතු ද? නැතිනම් සටන් කරන ලෙස පවසන වැකි ආදර්ශයට ගෙන මෙලොව ජීවත් වන ඉස්ලාමය නො අදහන සෑම පුද්ගලයකු ම ඝාතනය කළ යුතු ද?

මේ පිළිබඳ ව ඇති එක් විවරණයක් වන්නේ මෙම වැකි යුධමය වාතාවරණයන් තුළ, එනම් නබිතුමාගේ සමකාලීන වූ අන්‍යාගමික කණ්ඩායමුත් නබිතුමා සහ ඔහුගේ සහචරයනුත් සමග යුද්ධ පැවති අවස්ථාවන්හි දී පහළ වූ බවයි. එම කණ්ඩායම් නබිවරයාටත් ඉස්ලාමයටත් සතුරුකම් කළ බැවින් ඉස්ලාමය සුරක්ෂිත කරගැනීමේ අදහසින් ඔවුන් සමග යුද්ධ කිරීමට දෙවියන්වහන්සේ අවසරය දුන් බවත් ය. එහි දී ද තමාට එරෙහිව සටන් කරන්නන් හා සමග පමණක් සටන් කරන ලෙසත් සාමය දෙසට නැඹුරු වන්නන්ට සතුරුකම් නොකරන ලෙසත් පවසා තිබෙන බව යි. මේ මතයට සහාය දක්වන වැකි ද කුරානය තුළ බෙහෙවින් හඳුනා ගත හැකි ය.

> ධර්මය වෙනුවෙන් සටන් කරනු. නමුත් ඔබ සීමාව ඉක්මවා නොයනු. අල්ලාහ් නියත වශයෙන්ම සීමාව ඉක්මවන්නන් ආදරය කරන්නේ නැත. (2: 190)

> එහෙත් ඔබ සමග ගිවිසුමක් ඇතිකරගත් අය සමග ගිය අයවද, ඔබට විරුද්ධව යුද්ධ කිරීමට සිත නොදී ඔබ වෙත පැමිණි අයවද, කපා නොදමනු. සිරභාරයට නොගනු. මන්දයත් අල්ලාහ් අදහස් කළහොත් ඔවුන් ජයග්‍රහණය කර, ඔවුන් ඔබව කපන මෙන් සලස්වන්නට ඉඩ තිබුණි. එබැවින් ඔබ සමග යුද්ධ නොකර ඇත් වී සිට ඔබ වෙතින් සමාදානය ඉල්ලා සිටියහොත් එය බාර ගනු. මන්දයත් මෙවැන්නන් සමග යුද්ධ කිරීමට අල්ලාහ් ඔබට කිසිම මගක් තැබුවේ නැත. (4: 90)

> ධර්මය සම්බන්ධව නුඹලාට එරෙහිව සටන් නොකළාවූ අයහටද එමෙන්ම නුඹලාව නුඹලාගේ නිවෙස්වලින් පිටුවහල් නොකළාවූ අයහටද නුඹලා යහපත කර ඔවුන් සමග යුක්ති සහගතව ක්‍රියා කිරීම අල්ලාහ් නුඹලාට තහනම් නොකරන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් යුක්ති සහගතව ක්‍රියා කරන්නන්ව ප්‍රිය කරන්නේය. (60: 9)

නමුත් තවත් මතයක් වන්නේ මුල්යුගයේ අන්‍යාගමිකයන් සමග සාමකාමී ව කටයුතු කිරීමට අණ කර තිබුණත් පසුව එය වෙනස් කර ඇති බව යි. යම්කිසි කුරාන වැකි දෙකක් අතර ගැටුමක් තිබුණහොත් පසුව පහළ වූ වැකිය වලංගු බවටත් එය විසින් ඊට පෙර පහළ වූ වැකිය අහෝසි කර ඇති බවටත් සැලකේ. මේ සිද්ධාන්තය නස්ක් යනුවෙන් හැඳින්වේ. කුරානයේ 2: 106 සහ 16: 101 වැකි මත මෙය පදනම් වී ඇත. විශිෂ්ටයන් ලෙස පිළිගනු ලබන මධ්‍යකාලීන යුගයේ විසූ ඉස්ලාමීය විද්වතුන් එක්තරා පිරිසකගේ අදහස වී ඇත්තේ ආගමෙහි බලකිරීම් නොමැති බව පවසන 2: 256 වැකිය සහ තවත් එවැනි අන්‍යයන් සමග සාමකාමීව කටයුතු කළ යුතු බව පවසන වැකි රැසක්, අන්‍යාගමිකයන් දුටුතැන මරාදැමිය යුතු බව කියන 9: 5

වැකිය විසින් අවලංගු කර ඇති බව යි.[4] කුරානයේ දෙවෙනියට තිබෙන අල්-බකරා පර්ච්ඡේදය පහළ වන්නේ 87 වැනියටත් 9 වැනියට තිබෙන අත්-තව්බා පරිච්ඡේදය පහළ වන්නේ 113 වැනියට බවත්[5] මෙහි දී සැලකිය යුතු ය.

හිබාත් අල්ලාහ් නම් විද්වතා සාමකාමී වැකි 124 ක් අහෝසි වී ඇති බව පවසන අතර අල් නහ්හාස් එවැනි වැකි 20 ක් මින් අහෝසි වන බව පවසයි. ඉබ්න් අල් ජවුසි එවැනි වැකි 22 ක් හඳුනා ගන්නා අතර මුස්තාෆා සායිද් වැකි 6 ක් පමණක් අහෝසි වන බවසයි. 11 වන සියවසේ විසූ මක්කි බින් අබි තාලිබ් නම් විද්වතා පවසන පරිදි අත් තව්බා හි 5 වැනි ආයාව විසින් අන්‍යාගමිකයන්ට සමාව දී ඔවුන් කෙරෙහි සාධාරණ ව සහ අනුකම්පාවෙන් කටයුතු කරන ලෙසට මීට පෙර කුරාන වැකි වලින් මුස්ලිම්වරුන්ට කළ සියලු අණ කිරීම් ප්‍රතික්ෂේප කරන බව පවසයි. 12 වැනි සියවසේ සිටි ඉස්ලාමීය විද්වතකු වන ඉබ්න් අල් ඇරබි ද අසිපත් වැකිය (9:5 මෙනමින් ද හැඳින්වේ.) විසින් අන්‍යාගමිකයන්ට සමාව දී ඔවුන් සමග සටන් නොකර ඉවත් වන ලෙස පැවසූ සෑම වැකියක් ම අහෝසි වන බව පවසයි.[6] අවසානයට පහළ වූ පරිච්ඡේදයට පෙර පහළ වන අත් තව්බා පරිච්ඡේදය අන් පරිච්ඡේදයන්හි තරම් සාමකාමීත්වය ගැන සඳහන් නොකරන බව මේ පිළිබඳ ව හදාරා ඇති බටහිර විද්වතුන් පෙන්වාදෙයි.[7]

කෙසේනමුත් අස්-සර්කානි නම් විද්වතා මෙමගින්, එනම් කුරානයේ 9: 5 වැකිය විසින් වෙනත් කිසිදු කුරාන වැකියක් අහෝසි නොවන බව පවසා තිබේ.[8] මෙම මතයට අනුව මෙම වැකිය හුදයිබියා නම් ගිවිසුම මුස්ලිම්වරුන් සමග ඇතිකරගෙන සිට පසුව එය බිඳ දැමූ අන්‍යාගමික කණ්ඩායම්වලට පමණක් අදාළ වන්නක් මිස සදහටම අදාල වන්නක් නොවේ. ඉස්ලාමීය නීතියට අනුව කිසියම් පාර්ශ්වයක් මුස්ලිම්වරුන් සමග සාම ගිවිසුමක් ඇති කරගෙන සිට එය කඩ කළහොත් ඔවුන් ඉස්ලාමය වැළඳ ගන්නා තුරු ම සටන් කෙරේ.

ගැටලු සහගත තවත් කරුණක් වන්නේ කුරාන වැකිවල පරිවර්තනය පිළිබඳ ව පවතින විවාදාත්මක තත්ත්වය යි. නිදසුනක් ලෙස කුරානයේ 2: 193 වැකිය දැක්විය හැකි ය. (මා පරිශීලනය කළ අබ්දුල් කාදර් මෂූර් මව්ලානා, ඒ. බී. එම්. කලීල් මවුලවි හා නසීම් ඉස්මයිල් විසින් කර ඇති කුරාන පරිවර්තනයේ මෙහි අරාබි පෙළෙහි පරිවර්තනයට අමතරව ඉස්ලාමයට විරුද්ධව කෙරෙන යනුවෙන් ආරවුලට අමුතු විශේෂණයක් එක්කර තිබේ. එහි පමණක් නොව තව බොහෝ කුරාන පරිවර්තනයන්හි මෙවැනි එක්කිරීම් කර තිබීමේ සැබෑ අරමුණ විමසිය යුතු ය.)

> ආරවුල පහ වී ධර්මය අල්ලාහ්ට ම අයත් යයි ස්ථිර වන තුරු ඔවුන්ට විරුද්ධව යුද්ධ කරනු. නමුත් ඔවුන් ඇත්වුවහොත් අපරාධ කරන්නන් හැර අන් අයට වේදනා කර සීමාව ඉක්මවා නොයනු.

මෙහි ආරවුල යනුවෙන් පරිවර්තනය වී ඇති වචනයට යෙදී ඇති අරාබි වචනය වන්නේ ෆිට්නා යන්නයි. ඉංග්‍රීසි පරිවර්තනයන්හි ද මෙම වචනය ම පරිවර්තනය නොකර දක්වා තිබෙනු දැකිය හැකි ය. ඉබ්න් කාතිර් සිය කුරාන් අර්ථවිවරණය හි ෆිට්නා යන්නෙහි අරුත දක්වන්නේ ෂිර්ක් හෙවත් සමානයන් තැබීම යන්නයි. මුෂින් ඛාන් ද සිය කුරාන පරිවර්තනය තුළ මෙම වැකිය පහත අරුත දෙන පරිදි පරිවර්තනය කරනු දැකිය හැකි ය.

> තව දුරටත් අවිශ්වාසය නොමැති වන තුරු සහ සෑම ඇදහිල්ලක් ම අල්ලාහ් උදෙසා ම පමණක් යැයි ස්ථිර වන තුරු ඔවුන් සමග ඔබ සටන් කරනු. නමුත් ඔවුන් වැළකුණොත් මිත්‍යා දෘෂ්ටික වන වෙනත් කණ්ඩායම් සහ කළහකාරීන්ට හැර අන් අයට පීඩා නොකරනු.

තවත් නිදසුනක් දැක්වුවහොත් කුරානයේ 2: 191 වැකිය හි අවිශ්වාසන්තයන් දුටුතැන ඝාතනය කරනු, ඔවුන් කරමින් සිටින කළබළය ඝාතනයට වඩා ඉතාමත් නපුරු ය යන්න තෆ්සීර් ඉබ්න් කාතිර් හි දැක්වෙන්නේ සමානයන් තැබීම ඝාතනයට වඩා ඉතාමත් නපුරු ය යනුවෙනි. ඉහත දැක් වූ, කුරානයේ අන්‍යාගමිකයන් ව ඝාතනය කරන ලෙස අණ කර ඇති වැකි රැසක භාෂා භාවිතය දෙස බලන විට එම වැකි සතුරු හමුදාවක් සමග සටන් කිරීමකට වඩා ධර්මය පිළිගන්නා තුරු සටන් කිරීමක් බව හැඟී යයි. 9: 3 සහ 9: 29 වැකිවලින්

4 https://en.wikipedia.org/wiki/Violence_in_the_Quran#Abrogation
5 https://www.missionislam.com/quran/revealationorder.htm
6 https://en.wikipedia.org/wiki/Naskh_(tafsir)#The_Sword_verse
7 https://en.wikipedia.org/wiki/Naskh_(tafsir)#The_Sword_verse
8 https://www.seekersguidance.org/answers/general-counsel/jihad-abrogation-in-the-quran-the-verse-of-the-sword/

මෙය ප්‍රශ්න නොකළ හැකි පරිදි පැහැදිලි වේ. ධර්මය අල්ලාහ් උදෙසා ම පමණක් වන තුරු සටන් කිරීම සහ අල්ලාහ්ගේ මාර්ගයෙහි යුද්ධ කිරීම යන්න සමග එක්ව ගෙන මෙය විමසා බලන්න.

අහමද් ජාවෙද් ගම්දි නම් පකිස්තාන මුස්ලිම් විද්වතා ඉස්ලාමය තුළ සාධාරණ ව පිළිගැනෙන යුද්ධය, එනම් ජිහාඩය දෙවිධියකට බෙදා දක්වයි. ඒ  අසාධාරණයකට සහ පීඩනයකට එරෙහි ව කරන යුද්ධයත්, සත්‍ය ධර්මය අනාවරණය කෙරුණු පසුවත් එය ප්‍රතික්ෂේප කරන්නන්ට එරෙහි ව කරන යුද්ධයත් යනුවෙනි. පළමු වර්ගයේ ජිහාඩය ඕනෑම යුගයක කළ හැක්කක් වන නමුත් දෙවන වර්ගයේ ජිහාඩය දෙවියන්වහන්සේ විසින් සිය ධර්මය පහළ කිරීමට තෝරාගත් සමූහයන්ට පමණක් අදාළ වේ. ඔවුන් එම ධර්මයේ තෝරාගත් සාක්ෂිකරුවන් වන බැවින් එය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට කිසිම හිමිකමක් නැත. එම සමූහයන්ගෙන් ධර්මය පිළිගැනීම ප්‍රතික්ෂේප කරන්නන්ට කිසිම සමාවක් නොලැබේ. ගැටලුව වන්නේ සාක්ෂි දරන්නන් හෙවත් තෝරාගත් සමූහයන් සමග ධර්මය පිළිගන්නා තුරු සටන් කිරීමේ වගකීම පැවරී ඇත්තේ නබිතුමන් සහ ඔහුගේ සගයන්ට පමණක් ද නැතිනම් මෙම වගකීම අනිකුත් මුස්ලිම් නොවන පිරිස් සම්බන්ධයෙන් නූතන මුස්ලිම්වරුන් විසින් ද දරනු ලබන්නේ ද යන්න ගැන ඉස්ලාමීය නීති විද්වතුන් අතර මත ගැටුමක් තිබීමයි.[9] මෙම වගකීම නූතන මුස්ලිම්වරුන් පිට ද පැටවෙන්නේ නම් සියලුම අන්‍යාගමිකයන්ට එරෙහි ව සටන් කිරීම මුස්ලිම්වරුන්ගේ ආගමික යුතුකමක් වේ. ලොව පුරා මුස්ලිම් විද්වතුන් සියයකට අධික පිරිසක් විසින් අයි. එස්. නායක අබූ බකර් බග්දාදිට යැවූ අවවාදාත්මක ලිපියේ ද මෙසේ සඳහන් වේ.

> ජිහාඩයේ අරමුණ පීඩනයෙන් මිදීම බැවින් අන්‍යාගමිකයන්ට එරෙහි ව කරන ආක්‍රමණකාරී, ප්‍රචණ්ඩ ජිහාඩයක් නොමැත. මෙය (ෂාෆි ඉ ගුරුකුලයේ විද්වතුන් කිහිපදෙනෙකු හැරුණු විට) අබූ හනීෆා, මාලික් සහ අහ්මද් සහ ඉබ්න් තයිමිය්‍යාහ් වැනි විද්වතුන්ගේ ද මතයයි.

ෂාෆි ඉ ගුරුකුලයේ විද්වතුන් කිහිපදෙනෙකු මෙම සාමකාමී මතයට විරුද්ධ මතයක් දරන බව ඉස්ලාමය සාමකාමී බව පෙන්වමින් ලිපියක් යවන එම විද්වතුන්ට ද පිළිගැනීමට සිදු ව තිබීමෙන් පෙනී යන්නේ ඉස්ලාමීය චින්තනය තුළ ප්‍රචණ්ඩත්වයට අනුබල දෙන මතවාදී දහරාවක්, කුරාන අර්ථවිවරණයක් පවතින බව නොවේ ද?

මෙම ලිපිය ආරම්භයේ ම මා සඳහන් කළ නබිවදන ගැන පැහැදිලි කරන පිළිතුරක් සීකර්ස්හබ් වෙබ් අඩවියේ එයි. උස්තාද් ෆරස් ඒ. ඛාන් විසින් සපයන එම පිළිතුර ෆරස් රබ්බානි විසින් පරීක්ෂා කර අනුමත කරන ලද්දකි. එම නබිවදන අරාබි අර්ධද්වීපයේ බහුදේවවන්දනාව කළවුන්ට පමණක් අදාළ බව පෙන්වාදෙන ඔහු තවදුරටත් මෙසේ පවසයි.

> අරාබි අර්ධද්වීපයේ සිටි බහුදේව වන්දනාකරුවන් හැර අනිකුත් අය සම්බන්ධයෙන් මුස්ලිම්වරුන් සමග අන්තර්සබඳතාවය හේතුවෙන් ඉස්ලාමයේ සහ එහි ශුද්ධ වූ නීතියේ  සුන්දරත්වය වටහා ගැනීමෙන් ඔවුන් ඒ කරා පැමිණෙනු ඇතැ යි අපේක්ෂා කෙරෙන ලදී. (පැහැදිලි කිරීම - එනම් බලාපොරොත්තුව පමණක් ප්‍රමාණවත් විය. ඔවුන් මුස්ලිම්වරුන් වන්නේ ද නොවන්නේ ද යනු හනෆි හා මලිකි මත අනුව වැදගත් නොවේ. හදීතය එම සුවිශේෂී කණ්ඩායම්වලට පමණක් අදාල වන බව ඔවුන්ගේ මතය වන බැවිනි.)[10]

මෙහි ද සඳහන් වන්නේ හනෆි හා මලිකි මත පිළිබඳ ව පමණි. නබිවදන් යනු ඉස්ලාමයේ කුරානයෙන් පසු වැඩි ම වටිනාමක් ඇති මූලාශ්‍රයයි. කුරාන වැකි අර්ථ විවරණයේ දී එය ඉතා ප්‍රබල මූලාශ්‍රයක් වේ. ඉස්ලාමය වැළඳගන්නා තුරු සටන් කිරීමට තමන් අණ ලබා ඇති බවට කියවෙන හදීතය විසින් පෙන්නුම් කෙරෙන්නේ කුරානයේ වැකි නබිවරයා විසින් අවබෝධ කරගත් අන්දමයි. ඒ අනුව ඉහත දැක්වූ ප්‍රචණ්ඩ සහ අර්ථය ගැටලුසහගත වැකි තේරුම් ගැනීමට මෙම හදීතය ඇසුරු කිරීමේ ප්‍රතිඵලය කුමක් විය හැකි ද?

මේ සියලු කරුණු දැක්වූයේ ඉස්ලාමය යනු ප්‍රචණ්ඩ දහමක් හෝ හුදෙක් ත්‍රස්තවාදය ම බව කියනු පිණිස නොවේ. ඉස්ලාමය ආශ්‍රිත ව ත්‍රස්ත ව්‍යාපාර රාශියක් (සස්නිවරු, සූර්වරු සිට අල් කයිඩා, අයි. එස්. දක්වා) ඇතිවීමේ හේතුව වටහාගනු පිණිස ය. අපට ගැටලුවක් නැති කළ හැක්කේ එහි හේතුව හරිහැටි වටහා ගත හොත් පමණි. නමුත් සංස්කෘතික ව සංවේදී වීමේ වුවමනාව හෝ ඉස්ලාම්විරෝධීන් ලෙස සැලකෙනු ඇත යන බිය හේතුවෙන් ත්‍රස්තවාදයට ආගමක් නැතැයි පවසමින් ඉස්ලාමය සහ ත්‍රස්ත ව්‍යාපාර ඇති මෙම

9 https://en.wikipedia.org/wiki/Violence_in_the_Quran#Warfare

10 https://www.seekersguidance.org/answers/general-counsel/jihad-abrogation-in-the-quran-the-verse-of-the-sword/

සබඳතාවය නො දකින විට හෝ නැතිනම් හුදෙක් මෙය විකෘති මනසක් ඇති අතලොස්සකගේ ක්‍රියාවක් බව පවසන විට සිදුවන්නේ සැබෑ හේතුකාරකය හඳුනාගැනීමේ සහ එය තුරන් කිරීමේ ඉඩ අපට අහිමි වීම නොවේ ද? හිටපු මුස්ලිම්වරියක මෙන් ම විශිෂ්ට මානව හිමිකම් ක්‍රියාකාරිනියක වන අයාන් හිර්සි අලිගේ කියුමකින් මෙය නිමාකරනු කැමැත්තෙමි.

> සාමයේ ආගම වගේ බයිලා කතා කියලා ඉස්ලාමය බේරලා පැත්තකින් තියන්නේ නැතිව බටහිර අපි දැන්වත් ඉස්ලාමයේ මතවාදය සහ ක්‍රියාකාරීත්වය ප්‍රශ්න කරමින් විවාදයකට මුලපිරිය යුතු යි. අමානුෂික ප්‍රචණ්ඩත්වය කරා යොමුවන එහි බැතිමතුන්ගේ ක්‍රියාකලාපයන්ට එය වගඋත්තරකරුවෙක් කරගත යුතු යි. එයට දැන්වත් ප්‍රතිසංවිධානය වන්නට හෝ මේ ක්‍රියාවලට අනුබල දෙන තැන් ඇත්නම් ඒවා පළවාහරින්නට බල කළ යුතු යි.

- සචින්ත මදූෂාන්